**පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සීහා එහි පරිපාලිත සමාගම් - 2021/2022**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී(“සමාගම“)සහ සමාගමේ හාඑහි පරිපාලිත සමාගම්වල (“සමූහය“)2022මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

සමාගමේ හා සමූහයේමූල්‍ය ප්‍රකාශන තුළින්2022මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම හා සමූහයඅඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගමේ හා සමූහයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම හා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හාතක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම්කර ක්‍රියාත්මක කරනලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමාගමේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ හෝ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍යප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගමක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගමකටයුතු කර ඇති බව,

- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව සමාගමප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කෙරෙහි අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| i. සමාගමේ වර්තමානපරිචය අනුව, හානිකරණ ක්‍රියාවලිය අතින් සිදුකරන ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේදී, අවශ්‍ය දත්ත ජනනය කිරීම සඳහා අභ්‍යන්තර වාර්තා කිහිපයක් කළමනාකරණය පිළියෙල කරයි. උදාහරණයක් ලෙස, නියමිත දිනය පසුකළ දින ගණන, පහසුකම්වල කල්පිරෙන දිනය, පළමු පැහැරහැරි දිනය, මුර ලැයිස්තුවේ සිටින පාරිභෝගිකයන් සහ නැවත උපලේඛනගත කළ පාරිභෝගිකයන් වැනි තොරතුරු ලබා ගැනීමේදී, සමාගමට තනි තොරතුරු මූලාශ්‍රයක් නොමැති අතර එබැවින්, එවැනි තොරතුරු ජනනය කිරීම සඳහා පද්ධති වාර්තා ගණනාවක් භාවිතා කරනු ලැබේ.<br><br>තවද, අධික ලෙස අතින් කරන කාර්යයන් පැවතීම සහ වාර්තා කිහිපයක් තනි පද්ධතියකට ඒකාබද්ධ කිරීම අතපසුවීම්, වැරදි ප්‍රකාශනයන් හා මානව වැරදිවලට තුඩුදියහැකිය. | අපි දැනටමත් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, දෙන ලද පැහැරහැරීමේ අලාභය (LGD), පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) සහපැහැරහැරීමේ නිරාවරණය (EAD) ගණනය කිරීම් පද්ධතිය හරහා සම්පූර්ණ කර ඇතත්, ආදර්ශයට කරනු ලබන අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හා කළමනාකරණ සම්බන්ධතා (overlays) හේතුවෙන් ඇතැම් ගණනය කිරීම් පද්ධතිය තුළින් කිරීමට නොහැකි විය.<br><br>උදාහරණ - ණය සහන ගැලපීම්, බාහිර විගණන ගැලපුම් ක්‍රියාත්මක කිරීම, වෙනස්වන ආර්ථික තත්වයන් යනාදී.<br><br>කෙසේ වෙතත්, සමාගම පද්ධතිය පදනම් ආදර්ශයක් තුළින් හානිකරණය ලබාගැනීමට වැඩකරමින් සිටියි. | මෙම ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සහ දත්ත මඟ හැරවීම හා මඟහැරීම මඟින් විය හැකි අවදානම වළක්වා ගැනීමට අතින් කරන මැදිහත්වීම අවම කිරීමටත් යෝජනා කරනු ලැබේ.ඊට අමතරව, විවිධ මූලාශ්‍රවලින් දත්ත උකහා ගැනීමට හා ඒවා පිළියෙල කිරීමට සහ විශාල එක්සෙල් වැඩපත්‍රිකා මත විශ්වාසය තැබීමට වැයවන කාලය එමඟින් ඉතිරි කර ගත හැකිවේ. |
| ii. මිල ප්‍රකාශිත ආයෝජන, මිල ප්‍රකාශිත නොවන ආයෝජන පොදු ලෙජර් ගිණුමේ වාර්තාවන බව විගණනය තුළදී නිරීක්ෂණය විය. 2022 මාර්තු 31 දිනට මිල ප්‍රකාශිත ආයෝජන පහත පරිදිය.<br>• ආසිරි හොස්පිටල් පීඑල්සී- කොටස් 500,000<br>• සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී - කොටස් 2,271,260<br>• පීපල්ස් මර්චන්ට් පීඑල්සී- කොටස් 25,014,002<br>• එල්සීබී ෆිනෑන්ස් පීඑල්සී- කොටස් 5,000,000 | සමාගම මූල්‍ය ප්‍රකාශනවල මිල ප්‍රකාශිත ආයෝජන හා මිල ප්‍රකාශිත නොවන ආයෝජන නිවැරදිව වර්ගීකරණය කර ඇතත්, මෙම ආයෝජන වර්ග දෙකම තනි ගිණුමක නඩත්තු කර ඇත. ඒ අනුව, විගණකවරුන්විසින් මතුකරන ලද ඉහත ගැටළුව කළමනාකරණය සටහන් කර ගන්නා අතර, මිල ප්‍රකාශිත හා මිල ප්‍රකාශිත නොවන ආයෝජන වෙනුවෙන් වෙනම පොදු ලෙජර් ගිණුම් දෙකක් ඇති කරනු ලැබේ. | පැහැදිලි බව ඉහළ නැංවීම සඳහා මිල ප්‍රකාශිත හා මිල ප්‍රකාශිත නොවන ආයෝජන වෙනම පොදු ලෙජර් ගිණුම්වල හඳුනා ගැනීමට සමාගමට නිර්දේශ කරනු ලැබේ. |
| iii. ස්ථාවර වත්කම් පද්ධතියේ ඇති ඇතැම් වත්කම් වෙනුවෙන් වත්කම් කේතයක් ඇතුළත් නොවන බව විගණනය තුළදී නිරීක්ෂණය විය. ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයේදී වත්කම් තනි තනිව හඳුනාගැනීම දුෂ්කර කාර්යයක් වේ. | ස්ථාවර වත්කම් සඵලදායීව කළමනාකරණය සඳහා ව්‍යවසායික සම්පත් කළමනාකරණ (ERM) ආදර්ශයක් සමාගම සංවර්ධනය කර ඇතිඅතර දැනට මෙම ආදර්ශයට ස්ථාවර වත්කම් වර්ග ඇතුළත් කරමින් සිටියි. | සියලු වත්කම් වර්ග සඳහා වත්කම් කේතයක් වෙන් කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත් ස්ථාවර වත්කම් පද්ධතිය තුළට ඇතුළත් කිරීමටත් යෝජනා කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | සමාගම දැනටමත් ඇතුළත් කර ඇති විවිධ ස්ථාවර වත්කම් වර්ග අතරින්, ජෙනරේටර්, වායු සමීකරණ, නාම පුවරු සහ මෝටර් වාහනවල වත්කම් කේත අවසන් කර නව ERM ආදර්ශයට ඇතුළත් කර ඇත. ERM ආදර්ශයට කාර්යාල උපකරණ ඇතුළත් කරන අතර 2022 ඔක්තෝබර් 30 වන විට වත්කම් කේතකිරීම සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.<br><br>තවද, 2023 අප්‍රේල් 30 වන විට ඉතිරි සියලු ස්ථාවර වත්කම් වර්ග ඇතුළත් කර සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.ඒ අනුව, සියලු ස්ථාවර වත්කම් සඳහා වත්කම් කේත වෙන් කරන අතර ERM ආදර්ශය තුළ පිළිබිඹු කෙරේ. | |

## 1.6 තොරතුරු තාක්ෂණ පොදු පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාරිභෝගියෙක් ඔහුගේ ණය පහසුකම වෙනුවෙන් වාරික සඳහා වැඩිපුර ගෙවීමක් හෝ පාරිභෝගිකයකු නියමිත දිනට පෙර අදාල වාරික ගෙවා ඇති විටක පද්ධතිය ස්වයංක්‍රීයව, අදාල නොවන ණය ගිණුමට (Unapplied Credit Account -220205126) බැර කරයි. පහත සඳහන් ස්වයං විද්‍යුත් මුදල් පහසුකම් දෙක වෙනුවෙන් අදාල නොවන ණය ගිණුම් දෙකක සටහන් තොරතුරු තාක්ෂණ වාර්තාවේ (කළඹ) ගලපා නොමැති බව විගණනය අතරතුරදී නිරීක්ෂණය වු අතර පොදු ලෙජර් ගිණුම්වල හා කළඹ අතර රු. මිලියන 1.31 ක වෙනසක් වෙනසකට හේතු විය. | සටහන් කර ගන්නා ලදි.<br><br>තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව පද්ධතියේ විෂයගත පද්ධති දෝෂය පරීක්ෂා කරන ලද අතර 2022 අගෝස්තු 31 දින හෝ ඊට පෙර සජීවී පද්ධතිය තුළ නිවැරදි කරනු ලැබේ. | නිවැරදි කිරීම අවශ්‍ය වේ. |

| පහසුකම් අංකය | මුදල (රු) |
|---|---|
| ANLESC1800003100 | 1,000,000 |
| HOLESC1700012000 | 316,040 |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 8,295 ක බදු පෙර ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන7,095 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,200 කවර්ධනයක් නිරීක්ෂණය විය. ණය, ලැබිය යුතු දෑ හා වෙනත් අලාභ වෙනුවෙන් හානිකරණ වියදම සියයට 37.21 කින් අඩුවීම සහ වෙනත් මෙහෙයුම් ආදායම් සියයට 587.86 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2021/2022 | 2020/2021 | 2019/2020 | 2018/2019 | 2017/2018 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු. මිලියන) | 23,881 | 24,983 | 31,459 | 30,836 | 26,705 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | (4.41) | (20.58) | 2.02 | 15.47 | 21.16 |
| පොලී වියදම් (රු. මිලියන) | 10,832 | 13,064 | 15,787 | 15,646 | 14,500 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | (17.09) | (17.24) | 0.99 | 7.9 | 22.58 |
| බදු පෙර ලාභය (රු. මිලියන) | 8,295 | 7,095 | 6,554 | 8,672 | 7,070 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/ (අඩුවීම) (%) | 16.91 | 8.25 | (24.42) | 22.67 | 10.47 |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම/ (අඩු වීම) (රු.000) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ගාස්තුව හා වෙනත් අලාභ | (388,412) | (37.21) | අය කිරීමවල වර්ධනය ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, ඉකුත් මූල්‍ය වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදයේ හානිකරණ ගාස්තුව සමඟ සැසඳීමේදී, හානිකරණ හා වෙනත් අලාභ සියයට 37.21 කින් අඩුවිය. |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 817,485 | 587.86 | වෙනත් මෙහෙයුම් ආදායම් රු.මිලියන 817 කින් වැඩිවිය. මෙය ප්‍රධාන වශයෙන්ම, සමාගමේ පරිපාලිතවලින් 2020/21 වර්ෂයේ ලැබුණු රු.මිලියන 110 ක ලාභාංශ ආදායමට සාපේක්ෂව 2021/22 වර්ෂය සඳහා ලැබුණු රු.මිලියන 930.63 ලාභාංශ ආදායමට හේතුවෙනි. |

| | | | |
|---|---|---|---|
| වෙනත් මෙහෙයුම් වියදම් | 521,638 | 32.34 | 2020/2021 මූල්‍ය වර්ෂයේදී වසංගතයේ බලපෑම හේතුවෙන් සමාගමේ ව්‍යාපාරික මෙහෙයුම් මන්දගාමී විය. නමුත්, 2021/22 මූල්‍ය වර්ෂයේදී, සමාගම ව්‍යාපාරික කටයුතු විස්ථාපනය කළ අතර ඒ හේතුවෙන් මෙහෙයුම් වියදම් වැඩිවිය. |
| පොලී ආදායම | (1,101,919) | (4.41) | පොලී අනුපාත අඩුවීම හා COVID 19 පැතිරීමේ තුන්වන හා සිව්වන රැලි හේතුකොට ගෙන ණය සහන ක්‍රියාත්මකවීම මෙම අඩුවීමට ප්‍රධාන හේතුවිය. |
| පොලී වියදම් | (2,232,124) | (17.09) | ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාත අඩුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉකුත් මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2021/22 මූල්‍ය වර්ෂයේ පළමුභාගය තුළදී තැන්පතු මත පොලී අනුපාත අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. |

## 2.3. අනුපාත විශ්ලේෂණය

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| **විස්තරය** | **ආංශික අනුපාත** | **සමාගම** | |
|---|---|---|---|
| | | **2021/2022** | **2020/2021** |
| | % | % | % |
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 20.83 | 12.74 | 12.49 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 5.29 | 3.85 | 3.49 |
| ශුද්ධ පොලී ආන්තිකය | 8.02 | 8.10 | 7.58 |
| **වත්කම් ගුණත්ව අනුපාතය** | | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් (NPL) | 8.99 | 8.78 | 9.22 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර1ප්‍රාග්ධනය (අවම 7%) | 15.78 | 18.76 | 17.72 |
| මුළු ප්‍රාග්ධනය (අවම 11%) | 17.33 | 19.67 | 18.58 |